<u>සරත් - රනිල්- සම්බන්ධන් - හකීම් - සෝමවංශ</u>

රනිල්, සම්බන්ධන් හා හකීම් කවදත් එකට සිටියෝ ය. ඔවුන් සමග ප්‍රභාකරන් ද සොල්හයිම් ද බ්ලේක් ද නම්බියාර් ද එක්සත් ජාතීන්ගේ සංවිධානය ද රාජ්‍ය නොවන සංවිධාන ද ඊනියා මාධ්‍ය ව්‍යාපාරිකයෝ ද රාජ්‍ය නොවන බැළයෝ ද සිටියහ. එහෙත් කොපමණ බලවත් වුව ද ඔවුන්ට මහින්ද රාජපක්ෂ මහතා නම්මවා ගැනීමට නොහැකි විය. බටහිර හා වෙනත් බලවේග හමුවේ කොන්ද නොනමා සිටි මහින්ද රාජපක්ෂ මහතා හමුදාවන්ට බටහිරයන්ගේ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබූ ප්‍රභාකරන් පැරදවීමට හැකි විය. ප්‍රභාකරන් විජාතික බලවේගවල ආයුධ අතට ගත් නියෝජිතයා වූ අතර රනිල් ඔවුන්ගේ ඊනියා ප්‍රජාතන්ත්‍රික නියෝජිතයා විය. එහෙත් ඔහුගේ ප්‍රජාතන්ත්‍රවාදයේ රඟ හොඳින් දන්නේ ජ වි පෙරමුණ ය. ජ වි පෙ ඒ අත්දැකීම් ලබාගත්තේ වැඩි වශයෙන් ම බටලන්දෙනි.

කොටින්ට විරුද්ධව මානුෂික මෙහෙයුම් දියත් කෙරිණි. අපට දැන් අමතක වුව ද ලංකාව පුරා බුදු පිළිම වහන්සේගෙන් බුදු රැස් විහිදුනේ ඒ මෙහෙයුම් දියත් කිරීමත් සමග ය. මෙහෙයුම් සමග ජ වි පෙ පෙළ ගැසිණි. සරත් ෆොන්සේකා හෙවත් ඒ සරත් හමුදාපති ලෙස හමුදාව මෙහෙයවී ය. එහෙත් මහින්ද රාජපක්ෂ මහතා නොවන්නට, ඒ මහතා බටහිරට නොනැමෙන්නට මෙරට සටනක් නොතිබෙන්නට තිබිණි. සරත්ලා දාහක් හමුදාවල සිටියත් එක් මහින්ද කෙනකු හමුදාවන්ට දේශපාලන නායකත්වය නොදෙන්නට ප්‍රභාකරන් ඇතැම් විට මේ වන විට මෙරට හෝ මුහුදින් එතෙර හෝ ඊළමක් පිහිටුවා අවසන් ය.

එකල අප දැන සිටි සරත් ෆොන්සේකා සිංහලයන් වෙනුවෙන් පෙනී සිටියේ ය. ඔහු කැනේඩියන් පෝස්ට් පුවත්පතට ප්‍රකාශයක් කරමින් මෙරට අයත්වන්නේ සිංහල බෞද්ධයනට බව කීවේ ය. හමුදා මෙහෙයුම් අවසන් වූ පසු (වැඩි ඈතක නො වේ) අම්බලන්ගොඩ පැවති රැස්වීමක දී ඔහු කියා ඇත්තේ සුදු කොඩි රැගෙන පැමිණි ත්‍රස්තවාදීන් මරා දැමුණු බව ය. ඒ කරනු ලැබුවේ කවුරුන් විසින් ද කාගේ අණින් ද ආදි ප්‍රශ්නවලට ඔහු කිසි දිනෙක පිළිතුරු නුදුන්නේ ය. කෙසේ වෙතත් අප ඒ සරත් දැනසිටියේ දේශප්‍රේමී නිලධාරියකු ලෙස ය.

ජ වි පෙ නායකයන් කියන ආකාරයට දැනට මාස කිහිපයකට පෙර ඔවුන් සරත් ෆොන්සේකා සමග ජනාධිපතිවරණය ගැන සාකච්ඡා පවත්වා ඇත. ඒ සමග මංගල සමරවීර හා එ ජා ප සමග ද සාකච්ඡා පවත්වන ලද බවට සැකයක් නැත. ඒ මහින්ද රාජපක්ෂ මහතා පරදවා සරත් ෆොන්සේකා ජයග්‍රහණය කරවීමට ය. මහින්ද රාජපක්ෂ මහතා පරදවන්නේ කුමක් සඳහා ද? ජ වි පෙ රනිල් මංගල ආදීන් කියන්නේ දූෂණ හා ජීවන වියදම වැඩිවීම නිසා මේ ආණ්ඩුව පරාජය කළ යුතු බව ය. මේ ආණ්ඩුව පරාජය කර ඔවුන් ඇතිකිරීමට යන ආණ්ඩුව දූෂණවලින් තොර නම් එවැනි ආණ්ඩුවකට ජීවන වියදම අඩුකළ හැකි නම් හා කියන තරම් දූෂණ මේ ආණ්ඩුවේ ඇත්නම් ඔවුන් කියන දෙයට ඇහුම්කන් දීමට තිබිණි. එහෙත් දූෂණ හා ජීවන වියදම පිළිබඳ ඔවුන්ගේ වාර්තාව කෙසේ ද?

එ ජා ප ආණ්ඩුවල දූෂණ ගැන අමුතුවෙන් කීමට දෙයක් නැත. රනිල් වික්‍රමසිංහ අද එ ජා පක්ෂයේ නායකයා වී සිටින්නේ ම දූෂණය නිසා ය. ඔහු ජේ ආර් ජයවර්ධනගේ බෑණා නොවන්නට ඥාති සංග්‍රහ නොවන්නට ඔහුට එ ජා ප නායකයා වීමට හැකි ද? එ ජා පක්ෂයේ තරම් ඒකාධිපති ව්‍යවස්ථාවක් වෙනත් කිසිම පක්ෂයක තිබේ ද? පරාදවීම පිළිබඳ වාර්තා පිහිටුවා ඇති රනිල් එ ජා ප නායකත්වයෙන් ඉවත්කිරීම මෙතරම් අපහසු වී ඇත්තේ පක්ෂයේ ව්‍යවස්ථාවෙන් නායකයාට අසීමිත බලතල ලැබෙන නිසා නො වේ ද? එ ජා ප ආණ්ඩු ජීවන වියදම අඩුකළ අන්දම මෙරට වැඩිහිටියෝ දනිති. රුපියල් දහයක වැටුප් වැඩිකිරීමක් වෙනුවෙන් සටන් කළ සේවකයන් මර්දනය කළ අන්දම අත්දැකීම් අඩු තරුණ තරුණියන්ට වැඩිහිටියන්ගෙන් අසා දැනගත හැකි ය. ජ වි පෙ අද මහ ඉහළින් සමරන ඉල් මහා විරුවන් එ ජා ප විසින් මරා දැමුණු අයුරු ජ වි පෙ නායකයන්ට අමතක වී ඇතත් ජනතාවට අමතක වී නැත.

මේ මෑතක වන තුරුම අප සිතා සිටියේ සරත් ෆොන්සේකා විනය ගරුක දේශප්‍රේමී නිලධාරියකු ලෙස ය. ජනාධිපතිවරණයට ඉදිරිපත් වී ඇති මේ සරත් කෙසේ වෙතත් ඒ සරත් දූෂිතයකු නොවේ යැයි අපි විශ්වාස කෙළෙමු. එහෙත් දැන් දැන් ලැබෙන තොරතුරු අනුව ඒ සරත් ද මේ සරත් ම වන බව පැහැදිලි ය. ආයුධ ජාවාරම් ගැන ඉදිරිපත් කෙරෙන කතා විශ්වාස කළත් නොකළත් ඔහු ටෙන්ඩර මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කර තම කීර්තිය නැතිකරගෙන ඇත. තමාට අයත් නැති ටෙන්ඩර මණ්ඩල සභාපතිකමක් යමකු බලයෙන් කරන්නේ යහපාලනයක්

උදෙසා නම් නොවන බව පැහැදිලි ය. ඔහුගේ සුදු කොඩි නාඩගමත් සමග ඔහු එක්කෝ තම සහෝදර නිලධාරීන් පාවාදුන්නේ ය. නැත්නම් බටහිරයන්ගේ අවශ්‍යතාවට බොරු සුදු කොඩියක් නිර්මාණය කර ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට හා හමුදාවට බොරු චෝදනා එල්ල කෙළේ ය. ඒ කුමක් වුවත් නීතිය අනුව හැකිනම් ඔහු වහාම මෙරට යුද්ධාධිකරණය ඉදිරියට ගෙන ආ යුතු ය.

ඒ සරත් මේ සරත් වන්නා සේම ඒ ජ වි පෙ බොහෝ කරුණු අතින් මේ ජ වි පෙ ද වෙයි. අනුර දිසානායක ජ වි පෙ එ ජා ප තුරුළට දක්කාගෙන ගොස් එහි ඊනියා වමේකම පළුදු කරන්නට ඇත. එහෙත් ජ වි පෙ නායකයන් මනෝ ගනේෂන්, රනිල් හා හකීම් පමණක් නොව සම්බන්ධන් සමග ද එකට සිට ගනිමින් ඔවුන්ගේ ජාතිකත්ව වෙස් මුහුණ ගලවා ඇත. ජ වි පෙ කලකට පෙර ද වික්‍රමබාහුලා සමග එක වේදිකාවට පැමිණ ඊළම වෙනුවෙන් පෙනී සිටියේ ය. අප ඒ තේරුම් ගත්තේ ජ වි පෙ ජාතිකත්වය හා මාක්ස්වාදය අතර දෝලනය වීමේ දී කසිකබල් මාක්ස්වාදය දෙසට ඇදී ගිය අවස්ථාවක් ලෙස ය. එහෙත් ඒ අර්ථකථනය වැරදි බව අද පැහැදිලි වෙයි. ජ වි පෙ එදා ඇතැම් අවස්ථාවල ජාතිකත්ව වෙස් මුහුණ පැළඳ සිට ඇත. රනිල්, මනෝ ගනේෂන් හා සම්බන්ධන් සමග එකතු වීමෙන් පසුව ජ වි පෙට මින් පසු ඒ වෙස් මුහුණ පැළඳ ගත හැකි නො වේ. එහෙත් ඒ එතරම් නිවැරදි කියමනක් නොවන්නේ එසේ වෙස් මුහුණු පැළඳීමට ජනාධිපතිවරණයෙන් පසුව ජ වි පෙ බලවේගයක් ලෙස ඉතුරු නොවන බැවිනි. ජ වි පෙ මෙරට දේශපාලනයේ බලපෑමක් කළ නොහැකි නාම පුවරුවට හා ලිපි ශීර්ෂවලට පමණක් සීමා වූ තවත් කුඩා කසිකබල් මාක්ස්වාදී පක්ෂයක් පමණක් බවට පත්වනු ඇත.

දෙමළ ජාතික සංධානය ද අද කැඩී ගොස් ය. එහි දහදෙනකු සම්බන්ධන් සමග සිටිනවා විය හැකි ය. සම්බන්ධන් යනු මනෝ ගනේෂන් මෙන් ම උග්‍ර දෙමළ ජාතිවාදයෙකි. සම්බන්ධන් සෘජුව ම ප්‍රභාකරන් වෙනුවෙන් පෙනී සිටියේ ය. ඇතැම් දෙමළ ජාතික සංධාන නායකයන් ජීවිතාරක්ෂාව සඳහා ප්‍රභාකරන් වෙනුවෙන් පෙනී සිටිය ද සම්බන්ධන් සිංහල විරෝධී උග්‍ර දෙමළ ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටියේ ය. එකල ඔහු පාර්ලිමේන්තුවේ කොටි සංවිධානය නියෝජනය කෙළේ ය. සම්බන්ධන් පසුගිය දා තම සහාය දීමට නම් ජනාධිපති අපේක්ෂකයන් එකඟ විය යුතු කොන්දේසි දහහතරක් ඉදිරිපත් කෙළේ ය. ඒ අතර උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම, අධිආරක්ෂක කලාප ඉවත්කිරීම, උතුරේ හා නැගෙනහිර හමුදා ශක්තිය අඩුකිරීම, ඊනියා සරණාගතයන් (මොවුන් අතර කොටි ත්‍රස්තවාදීහු ද වෙති.) නිදහස් කිරීම ආදිය ද විය. ඒ පැහැදිලිව ම නැවතත් ඊළම වෙනුවෙන් ය. මහින්ද රාජපක්ෂ මහතා ඒ නො පිළිගත්තේ ය. එහෙත් පැහැදිලිව ම සරත් ෆොන්සේකා මුළු මහත් ජාතියත් හමුදා ජයග්‍රහණයත් පාවාදෙමින් ඒ කොන්දේසි පිළිගෙන ඇත. නො එසේ ව සම්බන්ධන් සරත් ෆොන්සේකාට සහාය නොදෙනු ඇත.

සම්බන්ධන් හෝ ටිල්වින් සිල්වා හෝ වෙනත් අයකු මේ සම්බන්ධයෙන් සුදුළුණු පොඩි කළ යුතු නො වේ. සම්බන්ධන් සරත් ෆොන්සේකා හා මහින්ද රාජපක්ෂ යන දෙදෙනාගෙන් සරත් ෆොන්සේකා තෝරාගන්නා විට එසේ තෝරාගන්නේ ඇයිදැයි දැනගැනීමට අංජනම් එළි බැලිය යුතු නො වේ. සරත් ෆොන්සේකාට ප්‍රශ්නයක් ඇති බවත් ඒ ප්‍රශ්නයෙන් ගැලවීමට ඔහු බටහිරයන් හා සියළු විජාතික බලවේග වෙනුවෙන් රට ජාතිය හා හමුදාව පාවාදීමට සූදානම් බවත් පැහැදිලි ය. උතුරට ගිය රනිල් මහින්ද පෝඩා යැයි කීවේ ය. ඒ අතර ඔහු තවත් දෙයක් ද කීවේ ය. මහින්ද රාජපක්ෂ හා වෙනත් අය සිංහල රටේ සිංහලයන්ගේ වීරයන් බව ද කීවේ ය. ඔහුට අවශ්‍ය සිංහල රටේ සිංහල වීරයන් පළවා හැරීම බව පැහැදිලි ය. එසේ පළවා හරින්නේ කාගේ වුවමනාවට දැයි අපි දනිමු.

රනිල් මහින්ද පෝඩා යැයි කීවේ සරත් ෆොන්සේකා සිටි වේදිකාවේ ය. සරත් ෆොන්සේකා එයට විරුද්ධව කිසිවක් කියා ඇති බව වාර්තා නො වේ. සම්බන්ධන්ගේ යෝජනාවලට සරත් ෆොන්සේකා එකඟ වන්නේ රනිල් සමග ද සාකච්ඡා කිරීමෙන් පසුව බව පැහැදිලි ය. මේ ද්‍රෝහීන්ට අවශ්‍යවන්නේ මහින්ද රාජපක්ෂ මහතා විජාතික බලවේගවලට නොනැමී හමුදාවට දේශපාලන නායකත්වය දී ලබාගත් ජයග්‍රහණය ආපසු හරවා රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් දිනාගත් සියල්ල රටට හා ජාතියට අහිමි කිරීමට ය. ජ වි පෙ ද ඔවුන් සමග ලගිමින් දේශපාලන වශයෙන් සියදිවි නසාගෙන ඇත. අපි මොවුන්ට දෙමළෙන් නොව සිංහලෙන් ම පලයව් යැයි කියමු.